www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාවෝවාදීන්ගේ නායකත්වයෙන් නේපාලය තුළ නව ආන්ඩුවක් පිහිටුවයි

## New Maoist-led government installed in Nepal

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**
**2008 සැප්තැම්බර් 02**

අප්‍රේල් මාසයේ පැවති මැතිවරනයෙන් ඉක්බිති දේශපාලන පක්ෂ අතර මාස ගනනාවක කාකොටා ගැනීමකින් පසුව අගෝස්තු 22 නේපාල මාවෝවාදී කොමියුනිස්ට් පක්ෂයේ (නේකොප-(මා) නායකත්වයෙන් සභාග ආන්ඩුවක් පිහිටුවී ය. නේපාල කොමියුනිස්ට් පක්ෂය - එක්සත් මාක්ස් ලෙනින්වාදී (නේකොප-එමාලෙ) සහ වාර්ගික පදනමක් සහිත මදෙසි ජනතාවගේ අයිතීන් පිලිබඳ සංසදය (මජඅස) සභාගයේ සෙසු පාර්ශව කරුවෝ වෙති. අමාත්‍ය මන්ඩලයේ දෙවැනි තනතුර සඳහා ආරවුල විසඳීමෙන් පසුව නේකොප-එමාලෙ පක්ෂයේ ඇමතිවරු ඊයේ දිවුරුම් දුන්හ.

මාවෝවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂයේ සභාපති පුෂ්පා කමල් ධාල් හෙවත් වඩා හොඳින් ඔහුගේ අන්වර්ත නාමයෙන් ප්‍රචලිත ප්‍රචන්ඩ නව ආන්ඩුවේ අගමැති ය. අගෝස්තු 15 නේපාල කොංග්‍රස් පක්ෂයේ අපේක්ෂක ෂේර් බහදූර් ඩියුබා පරාජය කරමින් ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයේ ඡන්ද 602න් සියයට අසූවක් දිනාගැනීමෙන් පසුව ඔහු අගමැති තනතුරට පත් කරනු ලැබී ය. තත්වාරක්ෂක නේපාල කොංග්‍රසය පාලක සභාගයෙන් පිටත සිටීමට තීන්දු කර ඇත.

මුදල් ඇමති වන නේකොප-(මා) න්‍යායාචාර්ය බාබුරාම් භට්ටාරායි සහ ආරක්ෂක ඇමති වන පක්ෂයේ හිටපු ගරිල්ලා කොමාන්ඩර් රාම් බහධූර් තාපා නව අමාත්‍ය මන්ඩලයේ ප්‍රධාන තනතුරු දරති. මජඅස නායක උපේන්ද්‍රා යදෙව් විදේශ ඇමති වන අතර නිල වශයෙන් අමාත්‍ය මන්ඩලයේ තුල දෙවන තනතුරට නම් කිරීමෙන් පසුව නේකොප-එමාලෙ නායක බාම්දේව් ගෞතම් ස්වදේශීය ඇමති තනතුරට පත් කර තිබේ.

ආන්ඩුව විසින් පොරොන්දු වී ඇති පරිදි වසර දෙකකින් ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීම ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයේ වගකීම වෙයි. ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයේ ප්‍රථම ක්‍රියාව වූයේ රාජාන්ඩුව අහෝසි කිරීම සහ පලල්ව මහජන වෛරයට ලක් වූ ගයනේන්ද්‍ර රජුගේ බලතල අහෝසි කොට සාමාන්‍ය පුරවැසියෙකුගේ තත්වයට පත් කිරීම ය. ආසන 220ක් සහිත ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයේ විශාලතම කන්ඩායම මාවෝවාදීන් වන අතර නේපාල කොංග්‍රසයට සහ නේකොප-එමාලෙ පිලිවෙලින් ආසන 115 සහ 108 හිමිව තිබේ.

පුෂ්පා කමල් ධාල් අගමැති තනතුරට පත් වීමෙන් පසුව උද්දාමයට පත්වූ බාබු රාම් භට්ටාරායි නේපාලයට "රන් යුගයක්" උදාවී ඇතැයි ප්‍රකාශ කලේ ය. "නේපාලය වීරයන් හොයාගෙන ඇති බව අපට හැඟෙනවා. කවර හෝ යුගකාරක සමාජයක් සඳහා අපට වීරවරයෙකු අවශ්‍යයයි" ඔහු ප්‍රකාශ කලේ ය. "යුරෝපයේ ධනපති විප්ලවයෙන් පසුව නැපෝලියන් ඉදිරියට ආවා. රුසියාවේ සමාජවාදය ස්ථාපනය කිරීමට ලෙනින් පෙරමුන ගත්තා. දස වසරක මහජන යුද්ධයකින් සහ මහජන ව්‍යාපාරයකින් පසුව නේපාලය තුල ප්‍රජාතන්ත්‍රවාදී සමූහාන්ඩුවක් ස්ථාපනය කිරීම සඳහා ප්‍රචන්ඩ ඉදිරියට පැමින සිටිනවා." ඔහු තව දුරටත් පැවසුවේ ය.

ලෙනින් පසෙකින් තැබූවත්, නැපෝලියන් සමගවත් නේපාල අගමැති සමාන කල නොහැකි ය. ඔහු සරලව ම, ව්‍යාපාරික ඇඳුම් කට්ටලයකට සහ කාර්යාල වරප්‍රසාදවලට සිය සෙබල ඇඳුම හුවමාරු කර ගත් ලෝකය පුරා ගරිල්ලා නායකයන් පෙලන නවතමයා වන්නේ ය. ධනපති ආන්ඩුවක මෙහෙයවීමට නේපාල-(මා) තීන්දුව කිසි දිනක සමාජවාදී හෝ කොමියුනිස්ට්වාදී නොවූ "තනිරටේ සමාජවාදය" සහ "අවධි දෙකේ විප්ලවය" පිලිබඳ ප්‍රතිගාමී ස්ටැලින්වාදී ඉදිරිදර්ශනය මත පදනම්වූ එහි ක්‍රියාමාර්ගයේ තර්කානුකූල ප්‍රතිඵලය යි.

මාවෝවාදී ආන්ඩුවක් විසින් පුද්ගලික දේපල ආරක්ෂා කිරීමට සහ විදේශ ආයෝජන සාදරයෙන් පිලිගැනීම ගැන සහතික වන බවට නේකොප-(මා) නායකයන් වන ප්‍රචන්ඩ සහ බාබුරාම් භට්ටාරායි ව්‍යාපාරිකයන්ට මාස ගනනාවක් පුරා පැහැදිලි කරමින් සිටිති.

අගෝස්තු 23 ඔහුගේ ප්‍රථම සජීවී රූපවාහිනී කථාවේ දී ප්‍රචන්ඩ මෙලෙස පොරොන්දු විය. "අපි පුද්ගලික සහ රාජ්‍ය පාර්ශවකාරකම සහිත මොඩලයක්

අනුගමනය කරන නව කාර්මික ආර්ථිකයන් ඇති කිරීමට කටයුතු කරන්නෙමු... කම්කරුවන් සහ සේවා යෝජකයන් අතර සම්බන්ධතා වර්ධනය කිරීම මගින් කාර්මික සාමය පවත්වාගෙන යනු ඇත."

ගයනේන්ද්‍ර රජුගේ ආඥාදායක පාලනයට එරෙහිව 2006 අප්‍රේල් මාසයේ දී පැන නැගුනු මහජන ව්‍යාපාරය ධනපති පන්ති පාලනයට තර්ජනයක් වීම වලක්වාලීම සඳහා මාවෝවාදීහු පසුගිය වසර දෙක තුල ඉමහත් වෙහෙසක් දැරූහ. "අවධි දෙකේ" න්‍යාය පිලිබඳ නේකොප-(මා) විසින් සමාජවාදය සඳහා අරගලය දින නියමයක් නැති අනාගතයකට අතහැර දමා රාජාන්ඩුව අහෝසි කිරීමේ දේශපාලන ඉල්ලීමට සීමා කලේ ය. එම අරමුන සඳහා නේපාල කොංග්‍රසය සහ නේකොප-එමාලෙ ඇතුලු නේපාල සංස්ථාපිතයේ දූෂිත පක්ෂ සමග නේකොප-(මා) හත් හවුලක් පිහිටුවීය. දස අවුරුදු ගරිල්ලා යුද්ධයකින් පසු 2006 දෙසැම්බර් මාසයේ දී ආයුධ බිම තැබූ ඔවුහු ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් සඳහා මැතිවරනයට සූදානම්වීමට අන්තර්කාලීන ආන්ඩුවකට ඇතුලු වූහ.

අප්‍රේල් මාසයේ මැතිවරනයේ දී විශාලතම ආසන සංඛ්‍යාවක් දිනාගැනීමෙන් පසුව ආන්ඩුවක් පිහිටුවීම සඳහා මාවෝවාදීහු මාස ගනනාවක් නින්දිත කේවලක යෙදී සිටියහ. බොහෝසෙයින් අදිමදි කිරීමෙන් පසුව නේපාල කොංග්‍රසය සහ නේකොප-එමාලෙ රාජාන්ඩුව අහෝසි කිරීම සඳහා මැයි මාසයේ දී ඡන්දය දී "ෆෙඩරල් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාන්ඩුවක්" ප්‍රකාශයට පත් කලහ. එහෙත් සෙසු ප්‍රධාන පක්ෂ ඔවුන්ගේ උත්සුකතා පිලිබඳව සහතිකයකින් තොරව මාවෝවාදීන් නායකත්වය දෙන ආන්ඩුවකට ඇතුල් වීමට අකැමති වූහ. ප්‍රධාන බලයන්ගේ විශේෂයෙන් ම එක්සත් ජනපදයේ සහ ඉන්දියාවේ පීඩනය යටතේ නේකොප-(මා), නේකොප-එමාලෙ සහ මජඅස ආන්ඩුවක් පිහිටුවීමට අවසානයේ දී එකඟ වූහ.

නේපාලයේ ජනාධිපති සහ උප ජනාධිපති තනතුරු සඳහා කලින් කෙරුන කාකොටාගැනීම් මගින් වර්තමාන සභාගයේ පහසුවෙන් බිඳෙන සුලුබව පෙන්නුම් කරයි. ප්‍රධාන ජනාධිපති තනතුර සඳහා ඉදිරිපත් වූ නේකොප-(මා) අපේක්ෂකයා යම්තමින් පරාජයට පත් කල නේපාල කොංග්‍රසයේ අපේක්ෂක ආම් බරාන් යදෙව්ට නේකොප-එමාලෙ සහයෝගය දුන්නේ ය.

## අවම පොදු ක්‍රියාමාර්ගය

ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ ජීවන තත්වයන් වර්ධනය කිරීම ගැන ඉච්ඡා බස් දොඩවන අතර සමාජ අසමානතාවයේ සහ පීඩනයේ මූලය වන ධනපති දේපල සම්බන්ධතා සහ ලාබ පද්ධතිය පවත්වාගෙන යාම සහතික කරන කරුනු 19 අවම පොදු ක්‍රියාමාර්ගයක් මත සභාග ආන්ඩුව පදනම් වී ඇත. ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිර්දේශිත ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීම් සහ වෙලඳ පොල ප්‍රතිසංස්කරන ක්‍රියාවට දැමීමේ කොන්දේසි මත ජාත්‍යන්තර ආධාර සහ ආයෝජන සඳහා ආන්ඩුව ආයාචනය කර තිබේ.

ක්‍රියාමාර්ගයේ සමහර කරුනු නේපාල සංස්ථාපිතයේ තත්වාරක්ෂක ස්ථර සමග ආන්ඩුව වේගයෙන් ගැටුමකට තල්ලු කරනු ඇත. නේපාල රාජාන්ඩුවේ ප්‍රධාන මුක්කුව වූ හමුදාව ගරිල්ලා සටන්කරුවන් හමුදාවට අනුයුක්ත කිරීමේ නේකොප-(මා) ඉල්ලීම යලි යලිත් ප්‍රතික්ෂේප කලේ ය. හමුදා නායක රුක්මන්ගාද් කට්වාල් මෙසේ පැවසූ බව වාර්තා විය. "දේශපාලනිකව පුහුනු කල ජනතා විමුක්ති හමුදාව (ජවිහ) නිල ඇඳුම් ලා ගත්, වෘත්තීමය වශයෙන් පුහුනු කල මිනිසුන් සහ ගැහැනුන් සිටින ආයතනයක් තුලට පිලිගත නොහැකි ය" අසහනයට පත් දහස් ගනනක් සටන්කරුවෝ ඔවුන්ගේ අනාගතය පිලිබඳ තීන්දුවක් බලාපොරොත්තුව තාවකාලිකව කඳවුරුවල ලතවෙමින් සිටිති.

රටේ ගැමි ජනයා අතර නේකොප-(මා) සමාජ පදනම රැක ගැනීමේ ඇස්බැන්දුමක් ලෙස ඉඩම් ප්‍රතිසංස්කරන සහ ඉඩම් අහිමි ගොවීන්ට ඉඩම් ලබා දීමත් ගැන පොදු ක්‍රියාමාර්ගය තුල සඳහන් වෙයි. එවන් පියවරයන් පලල් පරිමාවකින් ක්‍රියාවට දැමීමට දැරෙන කවර හෝ උත්සාහයක් රටේ ඉඩම් හිමියන්ගේ සහ ඊට සම්බන්ධිත ධනපති කොටස්වල විරුද්ධත්වයට මුහුන දෙනු ඇත. යථාර්ථයේ දී සෙසු රටවල මෙන් ම ගම්බද ජනයාගෙන් බහුතරය දුගීබවට හෙලමින් ඉඩම් ප්‍රතිසංස්කරන සහ අත්‍යාවශ්‍ය පහසු මූල්‍ය සහ තාක්ෂනික ආධාර සහ සමාජ සේවාවන් සීමා කෙරෙනු ඇත.

ජාත්‍යන්තර තලයේ දී, නව ආන්ඩුව, එකිනෙකට සතුරු කලාපීය සහ ප්‍රධාන බලයන් අතර තුලනය වීමේ උත්සාහයක නිරතව සිටියි. නේපාලය තුල "කල්පවත්නා සාමයක්" තහවුරු කිරීම සඳහා ප්‍රචන්ඩ ජාත්‍යන්තර ප්‍රජාවට ආයාචනය කලේ ය. මාවෝවාදී නායකයාට සහ නව ආන්ඩුවට එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව සහ සෙසු රටවල් ක්ෂනිකව ම සුභාශිංසනය කලහ. කෙසේ නමුත්, එක්සත් ජනපදය එහි ත්‍රස්තවාදී සංවිධානවල ලැයිස්තුවෙන් මාවෝවාදීන් ඉවත් කිරීම ගැන ඇඟවීමක් නැත.

ප්‍රචන්ඩාගේ ප්‍රථම සංචාරය වොෂින්ටනයේ සහ නව දිල්ලියේ සැලකිල්ලට යොමු වී තිබේ. චීනයේ හෝ නේපාලයේ පාලන තන්ත්‍රයන්ට සමාජවාදය සමග කවර හෝ සම්බන්ධයක් ඇතැයි කිසිවෙකුටත් මොනම මිථ්‍යාවක් තිබිය යුතු නැත. නමුත් බෙයිජිනය බලගතු සතුරෙක් ලෙස එක්සත් ජනපදය සලකයි. ඉහත දී ගයනේන්ද්‍ර රජු සමග එයට පැවති සමීප සම්බන්ධතා

චීනය වට කිරීමේ පලල් මූලෝපායක කොටසක් විය. කලාපීය ආධිපත්‍යය සම්බන්ධයෙන් චීනය සතුරෙක් ලෙස සලකන ඉන්දියාව, නේපාලය තම බල පරිධිය තුල ඇති බව සලකයි.

යහපත් සම්බන්ධතාවන් පවත්වා ගැනීමට ඇති කුතුහලය නිසා ඔහුගේ ප්‍රථම නිල සංචාරය වන්නේ ඉන්දියාවට යාම බව චීනයේ සිට ආපසු පැමිනි වහාම මාවෝවාදී අගමැති ප්‍රකාශ කලේ ය. නුදුරු අනාගතයේ දී වොෂිංටනයට යාමට අවශ්‍ය බව ද ඔහු ඇඟවුම් කලේ ය.

නේපාලය "සිංගප්පුරුවක්" බවට පරිවර්තනය කරන බව මාවෝවාදීහු ප්‍රකාශ කර ඇත්තාහ. වෙනත් වචනවලින් කිවහොත් කලාපීය ආයෝජන කඩඇනයත් (මධ්‍යස්ථානයත්) සහ ලාභ ශ්‍රම වේදිකාවත් බවට නේපාලය පරිවර්තනය කිරීම ය. ඔවුන්ගේ ආන්ඩුව වර්ෂ 2020 වන විට නේපාලයේ වාර්ෂික වර්ධනය සියයට 20 දක්වා සහ ඒක පුද්ගල වාර්ෂික ආදායම ඇමරිකානු ඩොලර් 3,000 දක්වා ඉහල දමන බවට ඔවුහු කයිවාරු ගසති.

සැබෑ තත්වය නම්, නේපාලයේ, සියයට 55 ජනයා දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත්වන ලෝකයේ දුප්පත්ම රටවලින් එකක් වන අතර ඉහල යන මිල ගනන් නිසා ජීවන තත්වයන් තව දුරටත් බාදනය වෙමින් තිබේ. ඒක පුද්ගල සාමාන්‍යය යන්තම් ඇමරිකානු ඩොලර් 280කි. ආහාර ද්‍රව්‍ය සම්බන්ධ උද්ධමනය සියයට 20 මට්ටමට ඉහල යමින් තිබේ.

වඩා හොඳ ජීවිතයක් පිලිබඳව වැඩ කරන ජනයාගේ අපේක්ෂාවන් ඔසවා තබා ඇති තතු තුල එහි ඇස් නිලංකාර කරන සහ චිත්තාකර්ශනීය සැලසුම් සාක්ෂාත් කර ගැනීමට අසමත් වන විට මාවෝවාදීන් නායකත්වය දෙන නව ආන්ඩුව සමාජ අතෘප්තියට සහ දේශපාලන විරුද්ධත්වයට මුහුන දෙනු ඇත.

© www.wsws.org